<u>කෑගල්ල ප්‍රාදේශීය සභාව</u>
<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබූ උඩම්බා සියඹලාපිටිය නැමති ඉඩමෙන් සභාවට ඔප්පුවක් මඟින් පවරන ලද වටිනාකම රු.250,000 ක් වූ අක්කර එකක බිම් කොටස ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.1,844 ක වරිපනම් බදු හිඟ මුදලක් සමාලෝචිත වර්ෂයේදී කපා හැරීමෙන් එම වටිනාකමින් ලැබිය යුතු වරිපනම් බදු අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම
------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 03 ට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.8,358,049 වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිනුම් ශේෂයන්ගේ එකතුව රු.8,250,852 ක් වූයෙන් වෙනස රු.107,197 ක් විය.

(ආ) මුල්‍ය ප්‍රකාශණවල දක්වා ඇති රු.9,362,325 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි අයිතම 14 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් නොකිරීම නිසා ගිණුම් වාර්තාවේ උප ලේඛන සමඟ වත්කම් ලේඛනය නොසැසඳී පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.61,278,565 ක් වූ අතර එයින් රු.17,433,048 ක් වසරකට වඩා පැරණි ශේෂයක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.25,876,320 ක් වූ අතර. එයින් රු.3,498,821 ක් වසරකට වඩා පැරණි ශේෂයක් විය.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

---------------------------------------------------

පහත දැක්වෙන නීත රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය 261.2.7 රීතිය | කවර ආකාරයක අග්‍රිමයක් වුවත් ,එය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු බව දැක්වෙතත් 2005 සහ 2015 වර්ෂ දෙක තුළ අවස්ථා 10 කදී නිකුත්කළ රු.143,908 ක අත්තිකාරම් මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි. |
| (ආ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජූලි 20 හා අංක 2/2011 (සංශෝධන01) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක කර පමණක් රු.12,345 ක මුදලක් සේවක භාරකාර අරමුදලට දායක ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.22,502,259 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.17,525,581 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,976,678 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,976,678 ක වර්ධනයට ආදායම් විෂයයන් 05 ක වැඩිවීම හා වියදම් විෂයයන් 05 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015ජන01 දිනට හිඟය | 2015දෙසැ31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015දෙසැ31 දිනට හිඟය: 2015ජන01 දිනට පැවති හිඟයෙන් | 2015දෙසැ31 දිනට හිඟය: වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 430,182 | 195,120 | 583,420 | 428,574 | 235,062 | 154,846 | 389,908 |
| (ii) බදුකුලී | 131,655 | 36,932 | 261,110 | 132,367 | 94,723 | 128,743 | 223,466 |
| (iii)වෙනත්ආදායම් | 11,811,770 | 4,881,237 | 12,500,000 | - | 6,930,533 | 12,500,000 | 19,430,533 |
| (Iv) උසාවි දඩ | 6,863,533 | - | 9,000,000 | - | 6,863,533 | 9,000,000 | 15,863,533 |
| (v) ආදායම් ආධාර | 2,097,822 | 2,097,822 | 28,119,186 | 26,021,454 | - | 2,097,732 | 2,097,732 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 15,863,533 |
| (ii) | මුද්දර ගාස්තු | 19,430,533 |

2.3.3 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අංක ඩබ්පී ඉසඩ්එජ්- 5059 දරන බැකෝ ලෝඩර් යන්ත්‍ර යේ 2015 ජූලි මස සිට දෙසැම්බර් 28 දින දක්වා කාලයට අදාල ධාවන සටහන් අනුව මීටර් පැය 45 ක් කුලී පදනම මත සේවයේ යොදවා තිබුණ ද යන්ත්‍ර කුලියට දීමේ ලේඛනයට අනුව මීටර් පැය 30 ක් සඳහා පමණක් මුදල් අයකර ගෙන තිබුණි. ඒ අනුව මීටර් පැය 15 ක් සඳහා රු.36,000 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ මහජන ප්‍රදර්ශනයට සවිකර තිබූ දැන්වීම් පුවරු 26 ක් සඳහා රු. 136,950 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඇ) බදු ගිවිසුම් ප්‍රකාරව කාලීනව කඩකුලී මුදල් අයකර නොගැනීමෙන් 2015 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපල කඩ කාමර දෙකකින් රු.121,960 ක මුදලක් අයකරගත නොහැකිව පැවතුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1989 වර්ෂයේ සිට හිඟ හිටි විදුලි ගාස්තු ලෙස ගිණුම් වල දැක්වෙන රු.463,142 ක මුදල නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාවේ සභාපති ධූර දැරූ තිදෙනෙකු වෙනුවෙන් ලබාදී තිබුණු රු.60,056 ක් වටිනා දුරකථන 03 ක් ධූර හැරගොස් වසර 01 ත් 10 ත් අතර කාලයක් ගතව තිබුණද ආපසු ලබා ගැනීමට හා සැපයුම විසන්ධි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) කෑගල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ 2015 පෙබරවාරි 03 දිනැති අංක සෞ.වෛ.නි.කෑ/2014 දරන ලිපියට අනුව කසල බැහැර කරන ස්ථානයක් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ නිර්දේශ ලබාගත යුතු බව දක්වා තිබුණ ද එවැනි නිර්දේශ නොමැතිව 2015 වර්ෂයේදී අවස්ථා 40 කදී ගලි බවුසරය මඟින් මළ ද්‍රව්‍ය බැහැර කර තිබුණි.

(ඈ) 2015 වර්ෂයේදී කට්ටි සැළසුම් අනුමත කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබූ ඉඩම් දෙකකට අදාලව සභාවේ ආදායම් පරීක්ෂකවරුන්ගේ තාවකාලික තක්සේරුව මත අත්තිකාරම් මුදල් ලබාගෙන තිබුණ ද, ඉඩම් කට්ටි විකුණන ලද තත්‍ය වටිනාකම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ අනවසර ඉදිකිරීම් 04 ක් සම්බන්ධව සභාව නිකුත් කළ නියෝග අනවසර ඉදිකිරීම්කරුවන් ක්‍රියාත්මක කළේද යන්න පිළිබඳව පසු විපරම් සිදුකර නොතිබුණි.

3.2 අවිධිමත් ගණුදෙනු

--------------------

2013 අප්‍රේල් 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2013 හි විධිවිධාන අනුව රියදුරු සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහානිල ඇඳුම් හා මැහුම් කුලිය වෙනුවට රු.4,000 ක් බැගින් ගෙවිය යුතු වුවත් , රියදුරන් ඇතුළු කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ 04 ක් සඳහා නියමිත මුදලට වැඩියෙන් රු.3,265 ක් ද 27 දෙනෙකු සඳහා නියමිත මුදලට වඩා රු.43,207 ක් අඩුවෙන් ද ගෙවා තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

-------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 අගෝස්තු සිට 2010 ජූලි දක්වා කාලය වෙනුවෙන් සභාවේ සේවකයින් දෙදෙනෙකු සඳහා සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 26684/14 දරන නඩුවේ තීන්දුව ප්‍රකාරව රු.211,257 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ආ) ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත සේවකයින් 05 ක් සඳහා සේවක අර්ථ සාධක අරමුදලට රු 22,704 ක් සහ සේවක භාරකාර අරමුදලට රු. 5,676 ක් ගෙවීම් කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 <u>අයවැය පාලනය</u>

වැය විෂයයන් 23 ක අනුමත ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා රු.22,709,500 ක් වියදම් කර තිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණය ගැති පාලනය හා ණය හිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය